# අභිලේඛන මූලාශ්‍රය තුළින් හෙළිවන අනුරාධපුර යුගයේ සෞඛ්‍ය ආරක්ෂණ රාජ්‍ය ප්‍රතිපත්තිය

ඒ.ඩී.ඒ.එල්.ඩී. සෙනෙවිරත්න[1]

අනුරාධපුර අවධියේ වැදගත් රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස සෞඛ්‍ය ආරක්ෂණ රාජ්‍ය ප්‍රතිපත්තිය හඳුනාගත හැකිය. සමකාලීන පාලකයන් සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තිය සඳහා දක්වන ලද ආකල්පය හඳුනාගැනීම පර්යේෂණ අරමුණ වේ. අනුරාධපුර යුගයේ අභිලේඛන මඟින් සෞඛ්‍ය ආරක්ෂණ රාජ්‍ය ප්‍රතිපත්තියේ ස්වරූපය කෙබඳුද යන්න විශ්ලේෂණය කිරීම පර්යේෂණ ගැටලුව වේ. ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ අනුරාධපුර අවධියේ අභිලේඛන මූලාශ්‍රය මඟින් දත්ත රැස්කිරීම සිදු කරන ලදි. සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ මැදිරිගිරිය ටැම් ලිපියේ සඳහන් වේ. "ආරෝග්‍ය සිධි" යනුවෙන් ආශිර්වාද පාඨය මෙහි අන්තර්ගත වේ. රාජ්‍ය අනුග්‍රහ දක්වන ලද රෝහල් පිළිබඳ සාධක මෙම ටැම් ලිපියේ විස්තර වේ. පස් වැනි කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ රාජකීය වෙදහලක් පිළිබඳ සඳහන් වේ. අනුරාධපුර ඇතුළු නුවර නැගෙනහිර දොරටුව ටැම් ලිපියේ මැදිරිගිරිය ආරෝග්‍ය ශාලාවට සිදුකළ ඉඩම් ප්‍රදානයක් පිළිබඳ "අප පහණ් හින්ද් වූ සීමාවෙහි ආවූ බිම මැඩිලිගිරි වෙද්හලට් බහාලුම් හයි" යනුවෙන් විස්තර වේ. පාලකයන් විසින් ආරෝග්‍යශාලා ආශ්‍රිතව පනවන ලද ව්‍යවස්ථාවන්වන් ද අභිලේඛන මූලාශ්‍රයවල සඳහන් වේ. මැදිරිගිරිය පුවරු ලිපියේ මරණයට පත්කරන ලද එළුවන් හා කුකුළන් ආරෝග්‍ය ශාලාවට ලබා දියයුතු බව නීති පණවා ඇත. වෙදහලට අයත් භූමිය පරිභෝජනය පිළිබඳ නීති ද වෙදහල් සේවය කරන වෛද්‍ය වරුන්ගෙන් අල්ලස් ගැනීම හා තෑගි බෝග ලබාදීම තහනම් කිරීම්, රෝහල් භූමියට අයත් ආසන්න ස්ථානයන්වල මත්පැන් පානය කිරීම හා ශබ්ද කිරීම්, සංගීත භාණ්ඩ වාදනය කිරීම් තහනම් කිරීමට නියෝග නිකුත් කර ඇත. ක්‍රි.ව දස වැනි සියවසට අයත් බෞද්ධ ගරාදි වැට පුවරු ලිපිය මඟින් මහජනතාවට පිරිසිදු ජලය පරිභෝජනය කිරීම අවස්ථාව සලසා දීම සඳහා රජු විසින් පණවන ලද ව්‍යාවස්ථාවන් හා පරිපාලන ව්‍යුහය පිළිබඳ විස්තර වේ. මිහින්තල පුවරු ලිපිය තුළින් ද සමකාලීන සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තිය හඳුනාගත හැකිය." ගිලන්වැ ගයන් ඉයැ නො යහන හිමියනට් වෙදුන් කියු සැඳැ වසග් දියැයුතු....." යනුවෙන් වෙදුන්ගේ නියමය පරිදි ආහාර ලබාදිය යුතු බව සඳහන් වේ. සිව් වැනි උදය රජුගේ බදුලු ටැම් ලිපියේ දී බුලත් විකිණීමේදී අනුගමනය කළයුතු ව්‍යවස්ථාවන් මඟින් සෞඛ්‍ය ආරක්ෂණ රාජ ප්‍රතිපත්තිය පැහැදිළි වේ. මෙම සියළුම අභිලේඛන සාධකයන් මඟින් රාජ්‍ය මැදිහත් වී සිදු කරන ලද සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද හා සෞඛ්‍ය හා සනීපරක්ෂාව සඳහා රජය දක්වන ආකල්පය මෙන්ම නිරෝගිමත් සමාජයෙක් බිහිකිරීමට පාලකයා දැක්වූ උන්දුව හා අනුග්‍රහයන් හඳුනාගත හැකිය.

ප්‍රමුඛ පද : අනුරාධපුර, අභිලේඛන, රාජ්‍ය ප්‍රතිපත්තිය, ව්‍යවස්ථා, සෞඛ්‍ය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.asithasenavirathna91@gmail.com